# බුදු දහම චීන සංස්කෘතිය තුළ හිමිකරගත් ස්ථානය පිළිබඳ ඓතිහාසික හා දාර්ශනික විමසුමක්

මැදවච්චියේ ධම්මජෝති හිමි

චීන බුදු සමයේ සංස්කෘතික හා දාර්ශනික පසුබිම පරීක්ෂණය කිරීමේදී චීනයේ ඓතිහාසික හා දාර්ශනික ගුරුකුල පිළිබඳ අවබෝධ කර ගැනීම වැදගත් වේ. ක්‍රි. පූ. යුගයේ සියයක් දාර්ශනික ගුරුකුල හා දාර්ශනිකයන් විසූ බව වාර්තා වේ. (yi bai Jia- 百家 ) ක්‍රි. පූ. 221-207 සමයට අයත් යැයි සැලකෙන චින් යුගයට පෙර හා බටහිර හැන් යුගය දක්වා වූ (ක්‍රි. පූ. 206 - ක්‍රි. ව. 25) දාර්ශනික සම්ප්‍රදාය පිළිබඳ අගනා විවරණයක් සිමාකෙන්ග් නැමැති චීන ඉතිහාසඥයා විසින් රචිත ඓතිහාසික වාර්තා (Shi Ji - 史记) (The Historical Records) නම් කෘතියේ සම්පිණ්ඩනය කොට දක්වා තිබේ.[1] එහි දැක්වෙන පරිදි එතුමා විසූ ක්‍රි. පූ. 110 පමණ වන විට ප්‍රධාන වශයෙන් චීන දාර්ශනික සම්ප්‍රදාය 6 ක් පැවති බව වාර්තා වේ. ඒවා මෙසේ හඳුන්වා දිය හැකිය.

I ඉන් යන්ග් ජියා (Yin yang Jia) (yin yang sohool)
II රූ ජියා (Ru Jia) (School of literati or comfucianist school)
III මෝ ජියා (Mo Jia) Mohist School or Mohism)
IV මින්ග් ජියා (Ming Jia) (School of names or Logicians)
V ෆා ජියා (Fa Jia) (Leagalist School)
VI දා ඕ ද ජියා (Dao De Jia) (Dao De school or Daoism)

ක්‍රි. පූ 46 සහ ක්‍රි. පූ 23 අතර විසූ යැයි සැලකෙන (Liu xin) ලියෝ ෂින් විසින් රචිත 'ෂු ස ලුවෙ' (Zhu zi lue)(Introduction to the Philosophers) නමැති කෘතියේ දාර්ශනිකයන් ප්‍රධාන ප්‍රවාහ දහයකට (10) බෙදා විග්‍රහ කර තිබේ.[2] එහිදී ඉහත ගුරුකුල හයට අමතරව තවත් හතරක් පහත සඳහන් අයුරින් ඉදිරිපත් කර තිබේ.